# තාරකීගේ සිහිනය



එල්.තෙනුරි මෙත්සලා පෙරේරා

කෘතියේ නම - තාරකීගේ සිහිනය

කර්තෘගේ නම - එල්.තෙනුරි මෙත්සලා පෙරේරා

කෘතිය පළ කළ දිනය - 2023.12.24

ලිපිනය - 8/1
ගාල්තැන්න පාර,
අම්පිටිය

දුරකථන අංකය - 076-0037297
078-8068790

ISBN 978-624-206-822-0



කතාව සහ චිත්‍ර
එල්.තෙනුරි මෙත්සලා පෙරේරා
3 වසර E
මහමායා බාලිකා විදුහල
මහනුවර

# පිදුම

මාගේ මෙම පොත් පිංචය

මාගේ ආදරණීය

මහමායා මෑණියන්ටද,

සෑම මොහොතකදීම වැරදි නිවැරදි

කරමින් මග පෙන්වූ

මාගේ ආදරණීය

පන්තිභාර ගුරුමෑණියන්ටද,

මාගේ දෙමව්පියන්ටද,

සහෝදර සහෝදරියන්ටද,

මෙම පොත් පිංචිය

ආදරයෙන් යුතුව පුදමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැංවීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතාව හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය පොතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවන් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් **“දිවිය දිනන විද්‍යුත් පොතක්”** ව්‍යාපෘතිය

හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතේට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොත් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි .



2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි වේග ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියටද ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු .

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලයේ ගුරුභවතුන්, දෙමාපියන්, ආදිශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට ස්තූතියි මෙමගින් පිරිනමමි .

සසිකලා සේනාධීර,
විදුහල්පතිනි,
මහමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
2023.11.01




ළමා සාහිත්‍ය කටයුතුවලදී දිවි දීමෙන් ළමා ලොව සුරැකීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන මහනුවර මහමායා බාලිකා විදුහල හා ගුරු මණ්ඩලයට ගෞරවනීය ස්තුතිය පළමුව පුදකරමි.

එල්.තෙනුරි මෙත්සලා පෙරේරා වන මාගේ මෙම නිර්මාණය ඔබ සියලු දෙනාට රසවින්දනය කිරීමට හැකි වේවායි බලාපොරොත්තු වෙමි.

කර්තෘ එල්.තෙනුරි මෙත්සලා පෙරේරා
ස්ථිර ලිපිනය
අංක 8/1,
ගාල්තැන්න පාර,
අම්පිටිය
දුරකථන අංකය 076-0037297
078-8068790

එකමත් එක ගමක තාරකී කියලා ළමයෙකු සිටියා. ඇයට හිටියේ අම්මා සහ තාත්තා පමණි. ඇයට තාම වයස අවුරුදු අටකි.





අම්මයි, තාත්තයි, තාරකීයි තුන්දෙනා සතුටින් ජීවත් වුණා. තාරකිගේ ගෙදර ළඟ එයාගේ පන්තියේම යාළුවෙක් හිටියා. මේ දෙන්නා හැමදාම ඉස්කෝලේ ඇරිලා ඇවිත් ගේ ළඟ තිබුණ ගඟ අයිනේ සෙල්ලම් කළා. දවසක් සෙල්ලම කර කර ඉන්න වෙලාවේ තාරකී එයාගේ යාළුවාගෙන් මෙහෙම ඇහුවා.

“කසුනි, ඔයා ආස නැද්ද සුරංගනාවියක් ඇත්තටම දකින්න?”

“ආසයි.” “ඒත් සුරංගනාවියෝ ඉන්නෙ සුරංගනා ලෝකෙනේ” කසුනි කිව්වා.

“ඇත්තටම සුරංගනා ලෝකයක් කියලා තැනක් තියෙනවද?” තාරකී ඇහුවා.

“ඔව්, අපේ අම්මා කිව්වා හොඳ වැඩ කළාම සුරංගනාවියෝ අපිට තෑගි දෙනවා කියලා” කසුනි කිව්වා.

“මම එහෙනම් හෙට ඉඳන් ගඟ ළඟ තියෙන වතුර මලෙන් අපේ අම්මාට වතුර ගිහින් දීලා උදව් කරනවා.” තාරකී කිව්වා.



එක දවසක් තාරකී වතුර ගෙන ඒමට ගිය වෙලාවේ සුරංගනාවියක් තාරකීට මෙහෙම කිව්වා.

“තාරකී ඔයා හැමදාම උදේ පාසල් යාමට පෙර මාව හමුවීමට එන්න. එවිට ඔයාට මම ඔයාගේ උපන්

දිනයට තෑග්ගක් දෙනවා. හැබැයි ඔයා හැම උදේටම අනිවාර්යෙන්ම එන්න ඕන.”

“හොඳයි, ඔබට බොහොම ස්තුතියි!” හැමදාම තාරකී ඒ විදිහටම කළා.



සුරංගනාවිය මෙහෙම කිව්වා.

“තාරුකී, ඔයා හොඳට කළා. හැබැයි, ඔයා උදේට විතරක් නෙමෙයි හවසටත් එන්න.”



“හරි මම එන්නම්”

“හැබැයි, ඔයාට එන්න බැරි වුනොත් ආයෙ ඔයාට කවදාවත් තෑගි ගන්න වෙන්නේ නෑ ඔයාගේ උපන්දිනයට තව සති 5ක් විතරයි තියෙන්නේ.”



“හරි මම එහෙම කරන්නම්.”

ආයෙත් තාරකී එහෙම කළා. හැබැයි මට දෙන තැග්ග මොකක්ද කියලා දවසක් සුරංගනාවිය හමුවී ඇහුවා.

“බෑ මට ඒක නම් කියන්න බෑ.”

“ඒ මොකද සුරංගනාවිය, මම ඔයා කිව්ව හැමදේම කළා”

“මම හරි දවසට තමයි කියන්නේ.”

“අනේ මට එය බලන්න ආසයි.”



“ඉවසන්න මම තව ළමයිටත් තෑගි බෙදනවනේ. ඒ නිසා මගේ තෑගි ඉවරයි. මම තෑගි හොයන්නේ බොහොම මහන්සි වෙලා. මම දන්නෑ ඔයාට හම්බවෙන තෑග්ග මොකක්ද කියලා. මම කොහොමත් ඔයාට කියන්නේ නෑ. මොකද මම ඔයාව පුදුම කරන්නනේ හදන්නේ.”



“අනේ මට සමාවෙන්න මම දන්නෑ ඔයා අනිත් අයටත් බෙදෙන බව. ඒ නිසා කිව්වේ.”

“ආ ඒකට කමක් නෑ.” “ඔයාට පාසල් යාමට පරක්කු වෙලා.”

“හරි මම යන්නම්.”

ආයෙත් දවසක් උදෑසන ආ වෙලාවක මෙහෙම කිව්වා.

“තාරකී, ඔයා රාත්‍රියටත් එන්න.”


“අනේ! මගේ අම්මයි තාත්තයි කැමති නෑනේ.”

“අම්මගෙන් හරි තාත්තගෙන් හරි අහල බලන්න.”

“හරි මම අහල බලන්නම්.”

තාරකී අම්මගෙන් අහලා බැලුවා .

අම්මා කැමැත්ත දුන්නා. එදා පෝය දවසක් ඒ නිසා හොඳට හඳ පායලා තිබුණා. හරියට දවල් වගේ. තාරකී බොහොම සතුටින් සිංදුවක් කිය කිය නට නටා සුරංගනාවිය හමුවීමට ගියා.







එකවරම තාරකීගේ කකුල ගලක වැදිලා ඇදගෙන වැටුණා. තාරකීට හොඳටම රිදුනා. එතකොට එයා හිටියේ ඇඳෙන් බිමට වැටිලා. තාරකී ඉක්මනින් නැගිට්ටා. ඒ එක්කම එයාගේ අම්මා කාමරේට ආවා.

“අන්න ඔයාට තාත්තා කතා කරනවා” අම්මා කිව්වා. තාරකී කාමරයෙන් එළියට ආවා ......

එයාගේ තාත්තාගේ අතේ තෑග්ගක් තියෙනවා තාරකී දැක්කා.

“තාත්තෙ, ඕක කාටද?”


“ඇයි මතක නැද්ද අද ඔයාගේ ඔයාගේ උපන්දිනේ නේ”

“ආ......ඔව් නේද....”

“මේ තෑග්ග මගෙනුයි අම්මගෙනුයි”

තාරකීට එතකොට තේරුනේ එයා දැක්කේ සිහිනයක් කියලා.

අද ඉස්කෝලෙ ගිහින් එයා දැකපු හීනේ ගැන කසුනිට කියන්න ඕනේ කියල හිතාගත්තා.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනය හේතුකොටගෙන පොතපතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අතෙකින් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාව ශාස්ත්‍රීය වශයෙන් ප්‍රදර්ශනාගාරයේ කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජාත්‍යන්තරයට ඩිජිටල් වේදිකාවට පිවිස හත්පතු අංකුර බවට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට  
සෙනෙවිරත්න මහලේකම්  
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතීන් නිර්මාපක  
2023.11.01